# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1893/37 – 2014 දෙසැම්බර් 18 වැනි බ්‍රහස්පතින්දා – 2014.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දෙක කෝරළේ සුළු කොට්ඨාසයේ. ලූල්වත්ත ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MAHA/UDD/ACQ/95/556 සහ 2002.10.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 01 සිට 03 දක්වා පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 8.760ක් පමණ වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබලි (03)ට මායිම්:

01. **කැබලි අංක 01 – ගැප්ලන්ඩ් වත්ත – ප්‍රමාණය: හෙක්. 6.817ක් පමණ**
උතුරට: දෙහිගොල්ල වත්ත; නැගෙනහිරට: රොස්මිල් වත්ත; දකුණට: ඇළ; බටහිරට: පාර (ප්‍රා. ස.).

02. **කැබලි අංක 02 – ගැප්ලන්ඩ් වත්ත – ප්‍රමාණය: හෙක්. 1.907ක් පමණ**
උතුරට: ඇළ සහ රොස්මිල් වත්ත; නැගෙනහිරට: රොස්මිල් වත්ත; දකුණට: ඇළ සහ ගැප්ලන්ඩ් වත්ත; බටහිරට: පාර.

03. **කැබලි අංක 03 – ගැප්ලන්ඩ් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.036ක් පමණ**
උතුරට: ඇළ; නැගෙනහිරට සහ දකුණට: ගැප්ලන්ඩ් වත්ත; බටහිරට: ඇළ (ප්‍රා. ස.).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

ඉඩම් අමාත්‍යාංශයේ අංකය: L03J/95/FR/160.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: උදු2/2/10/29.
2014 පෙබරවාරි මස 19 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
1200/6, 'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 – 138



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*